# කොළඹ වතු පැල්පත් වැසියන්ගේ සුබසෙතට "පුර නැඟුම" ව්‍යාපෘතියක්

## පළමු පියවර මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණ අතර දෙයි

(අමරදාස සිල්වා)

**කොළඹ නාගරික ප්‍රදේශයේ වතු හා පැල්පත් ආශ්‍රිතව වෙසෙන්නන් නීතිගරුක හා සහජීවනයෙන් යුත් පුරවැසියන් බවට පත් කිරීම සඳහා "පුර නැගුම" නමින් විශේෂ ව්‍යාපෘතියක් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාතයාංශය ආරම්භ කර තිබේ.**

මෙම මසරේ සිට ක්‍රියාවට නංවන එම ව්‍යාපෘතියේ පළමු පියවර සංකේතවත් කරමින් කොළඹ මාළිගාවත්ත මහල් නිවාස සංකීර්ණය ශ්‍රමදානයකින් පිලිසකර කිරීම පසුගියදා සිදු කැරුණි.

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමග කොළඹ මහ නගර සභාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පරිසර අමාත්‍යාංශය බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පහත්බිම් සංවර්ධන මණ්ඩලය රීල් ආයතනය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව එයට එක්විය.

කොළඹ මාලිගාවත්ත ශ්‍රී සුධර්මාරාධිපති ගොඩඋඩ ආරියධම්ම හිමියෝ සහ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ ශ්‍රී ලංකා ජාතික සංගමයේ සභාපති සිරිසේන කුරේ කොළඹ නාගරික කොමසාරිස් භද්‍රාණි ජයවර්ධන යන මහත්ම මහත්මීහුද මෙම අවස්ථාවට සහභාගි වූහ.



කොළඹ මාලිගාවත්ත මහල් නිවාස සංකීර්ණයෙන් ආරම්භ කරණු "පුර නැගුම" ව්‍යාපාතියට සභාපති වු මාලිගාවත්ත ශ්‍රී සුධර්මාරාමාධිපති ගොඩැඩ අරියධම්ම හිමි සහ අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ ඇමැති මිලින්ද මොරගොඩ, ශ්‍රී ලංකා ජාතික සංගමයේ සාපති සිරිසේන කුරේ, කොළඹ නාරික කොමසාරිස් හද්‍රාණි ජයවර්ධන යන මහත්ම මහත්මීහු ඡායාරූපයේ වෙති.